# මල්වතුඔය දකුණු නිම්නයේ වැනසී යන බෞද්ධ උරුමය හා අන්‍ය සභ්‍යත්වයන්හි වර්ධනයට බලපෑ හේතු පිළිබඳ පුරාවිද්‍යාත්මක විමර්ශනයක්

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආරිය ලගමුව[1], ගල්වැවේ විමලඛන්ති හිමි[2],
රදාවානේ සිරිසුමංගල හිමි[3]

## හැඳින්වීම

උතුරු පලාතේ වව්නියාව දිස්ත්‍රික්කයට අයත් සෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මල්වතුඔය දකුණු නිම්නයේ කොන්ග්‍රායන්කුලම් නම් ඓතිහාසික ආරාම සංකීර්ණය හා තදනුබද්ධ ආරාම රටාව පිළිබඳව ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා විෂය ඒකකය මගින් 2016 වර්ෂයේ සිදු කරන ලද ගවේෂණ ව්‍යාපෘතියේ ප්‍රතිඵල ආශ්‍රයෙන් තත් විහාර සංකීර්ණයන්හි ස්වභාවය හා ඒවා විනාශ වී ගිය ආකාරය ද, අන්‍ය සංස්කෘතික බලපෑම හා ඒ පිළිබඳ තත් ප්‍රාදේශීය ජනතාවගේ ආකල්ප රටාව පිළිබඳව ද කරන ලද පර්යේෂණ ආශ්‍රයෙන් උපයාගත් දත්ත මත සිදුකෙරෙන පර්යේෂණ ප්‍රතිඵල පිළිබඳ විග්‍රහයක් මේ තුළින් එළි දක්වනු ලැබේ.

## පර්යේෂණ ගැටලුව

උතුරු පලාතට අයත් මල්වතු ඔය දකුණු නිම්නයේ සම්භාවනීය බෞද්ධ සභ්‍යත්වය විනාශ වූයේ කෙසේ ද, ඒ සඳහා බලපෑ සාධක කවරේ ද, දේශපාලනික වශයෙන් සිදුවූ විපර්යාසයන් සමාජය වෙත කෙතරම් බලපෑමක් සිදුකළේ ද යන කරුණු පිළිබඳව සොයා බැලීම, අන්‍ය සභ්‍යත්වයන් තත් ප්‍රදේශය තුළ ස්ථාපනය වීමට බලපෑ සමාජීය අරමුණු කවරේදැ යි විමසීම.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා භාවිත කරන ලද්දේ ක්ෂේත්‍ර පර්යේෂණ ක්‍රමවේදය යි. අදාළ භූමිය මත ඇවිද බලා භෞතිකමය වශයෙන් මතුපිට සාධක ඒකරාශි කරගැනීම හා ඒවා විශ්ලේෂණය කිරීම මෙහිදී භාවිත කරන ලදි. උපකල්පනයන් හා ඒවායෙහි ප්‍රතිවිරුද්ධ මතවාදයන් ද විවේචනාත්මකව මෙහිදී භාවිත කළ අතර ඓතිහාසිකමය වශයෙන් ලේඛන මතින් හෙළිදරව් වන සාධක ද මෙහිදී යොදාගන්නා ලදි. ආකල්පමය වෙනස්වීම සම්බන්ධයෙන් ශතවර්ෂ දහයක්

---

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
[2] සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, bomaluwatemple@gmail.com
[3] සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

පමණ කාලයක සිදුවූ විපර්යාස මෙහිදී ප්‍රධාන වශයෙන් අවධානයට බඳුන් විය. පුරාවිද්‍යාත්මක වශයෙන් එකතුකර ගන්නා ලද හා විමර්ශනය කරන ලද නිශ්චල හා චංචල පුරාවස්තු හා ස්ථාන ප්‍රධාන වශයෙන් මේ පර්යේෂණයේ දී යොදාගන්නා ලදි.

අරමුණු

මෙම ක්ෂේත්‍ර පුරාවිද්‍යා පර්යේෂණය සිදුකිරීමෙන් අපේක්ෂිත අරමුණු කිහිපයකි.

1. මෙම ප්‍රදේශයේ ප්‍රාග්මානව ජනාවාස රටාවක් පැවතියේදැ යි සොයා බැලීම
2. මූල ඓතිහාසික ජනාවාස රටාව විමර්ශනය කිරීම
3. ඓතිහාසික යුගයේ ජනාවාසකරණය හා බෞද්ධගමික පසුබිම හා එහි අභිවර්ධනය විමසීමට ලක්කිරීම
4. අනුරාධපුර නාගරික ශිෂ්ටාචාරයේ ස්ථාවරත්වයට මෙම ප්‍රදේශයේ භෞතික හා මානව සම්පත්හි උපයෝගීතාව කෙලෙස බලපෑවේදැ යි විමර්ශනය කිරීම
5. මෙම ප්‍රදේශයේ බෞද්ධ ආගමික පසුතලය විමර්ශනය කිරීම හා එහි භෞතික විනාශයට බලපෑ සාධක කවරේදැ යි විමර්ශනය කිරීම

යන කරුණු ප්‍රධාන වශයෙන් මෙම පර්යේෂණයේ අපේක්ෂිත අරමුණු අතර විය.

සාකච්ඡාව

මෙම ගවේෂණ ව්‍යාපෘතිය මගින් සොයාගන්නා ලද දත්ත අතර මහ වනයෙන් වර්ෂ දහසක් පමණ වැසී පැවති පැරණි ස්මාරක රාශියකි. ඒවායින් සමහරක් මල්වතු ඔය උතුරු නිම්නයේ පවතින අතර ඇතැම් ඒවා පවතිනුයේ මල්වතු ඔයෙන් දකුණු නිම්නයේ ය. එයින් මෙහිදී දක්වනුයේ දකුණු නිම්නයේ පවතින ස්මාරක හා වෙහෙර විහාරයන් පමණි.

ප්‍රාග් ඓතිහාසික ස්ථාන වශයෙන් පැහැදිලිව හඳුනාගෙන ඇත්තේ කොන්ග්‍රායන්කුලම් ප්‍රාග් ඓතිහාසික ස්ථානය පමණි. එය නියොලිතිකයට පෙර යුගයේ මානව ජනාවාස පිළිබඳ පැහැදිලි තොරතුරු අනාවරණය කරන ලද ස්ථානයකි. අස්ථි හා ගල් ආයුධ, මානව අස්ථි කොටස් හා සත්ව අස්ථි විශාල ප්‍රමාණයක් ස්ථානයෙන් අනාවරණය වීම නිසා ශුෂ්ක කලාපීය ශ්‍රී ලාංකේය මානව ජනාවාස පිළිබඳව ලැබෙන මෙකී සාධක එම ප්‍රදේශයෙන් මෙතෙක් සොයාගන්නා ලද වැදගත්ම හා විශ්වාසවන්තම වූ ද පැරණිතම වූ ද සාධක වශයෙන් සැලකිය හැකි ය.

මූල ඓතිහාසික යුගය පිළිබඳ සැලකීමේදී ප්‍රදේශයෙන් ලැබෙන සාධක ප්‍රධාන වශයෙන් සියඹලාගස්වැව, කටුපොත, මැදවච්චිඑළිය වැනි සොයාගත් ස්ථානයන්ට සීමා වේ. මේ ස්ථානයන් මල්වතු ඔයෙන් උතුරු නිම්නය නියෝජනය කරන බව පෙන්වා දිය හැකි ය. බොහෝ විට මේවා පිහිටුවා ඇත්තේ මල්වතු ඔයට ආසන්නව ය.

මූල ඓතිහාසික යුගයෙන් පසු දැකිය හැක්කේ ඓතිහාසික යුගයේ නටබුන් ය. ඒවා අතර මුල්ම යුගයේ භික්ෂු නිවස්නයන් වශයෙන් භාවිත කළ ගල් ලෙන් විශාල සංඛ්‍යාවක් මේ ප්‍රදේශයෙන් අනාවරණය වේ. ඒවා ප්‍රකට කටාරම් සහිත ලෙන් හා ඇතැම් ඒවායෙහි ශිලාලේඛන ද සහිතව පැවැතෙන ඒවා ය. කන්නිමඩුව, මිල්ලකැලේ, කොන්ග්‍රායන්කුලම් යන ස්ථානයන්ගෙන් ගුහා ආරාම වශයෙන් භාවිත කළ ලෙන් 14 ක් පමණ සොයාගෙන තිබේ. මේවා බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය පැහැදිලිව සටහන් කරනු ලබන ඒවා වශයෙන් දැක්විය හැකි ය.

යකඩ උණු කිරීමට හා වෙනත් මානව අවශ්‍යතා සඳහා භාවිත කළ බවට පැහැදිලි සාධක ලැබෙන ගල් තලා කිහිපයක් ද මේ ගවේෂණයේදී හමු විය. ඒ අතර බෝගොඩ, කොන්ග්‍රායන්කුලම් හා රන්කෙත්ගම යන ස්ථානයන් විශේෂ වශයෙන් දැක්විය හැකි ය. මේවා මානව අවශ්‍යතා සඳහා විවිධ වශයෙන් භාවිතයට ගත් ඒවා බව ඒවාහි සිදුකර ඇති විවිධ විපර්යාසයන්ගෙන් සනාථ වේ.

පර්යේෂණයට ලක් කළ භූමි භාගයෙන් ප්‍රතිමා ගෘහ වශයෙන් භාවිත කළ, එසේම බුදුපිළිමවල කොටස් පැහැදිලිව දිස්වෙන ස්ථාන අටක් සොයාගන්නා ලදි. විනාශ කරන ලද වෙහෙර විහාරස්ථානයන්හි පිහිටි ස්තූප හතක් මේ ගවේෂණයේ දී පර්යේෂණයට භාජන කළ ප්‍රදේශයෙන් පමණක් සොයාගෙන තිබේ. මේ සියල්ලම දැඩි වශයෙන් හාරා විනාශකොට ඇත. ඒවාහි කලාත්මක අංග හා නිදන් වස්තු ඇතැ යි සැලකෙන සියලුම ස්ථානයන් විනාශ කොට දමා තිබේ. මේ තුළින් පැහැදිලි වන්නේ ප්‍රදේශයේ බෞද්ධ ජනාවාසයන් වල් බිහිව කැලෑවෙන් වැසී ගිය අවධියේ සිට නූතනය දක්වා ම ඒවා විටින් විට හාරා විනාශ කොට දැමූ බව යි. මේ සියලුම ස්ථානයන්හි ලොකු කුඩා විහාරාරාම දක්නට ලැබේ. විවිධ බෞද්ධ ගොඩනැගිලි වශයෙන් බෝධි ඝර, දාන ශාලා, උපෝසථ ඝර වැනි ආරාමික වාස්තුවිද්‍යා අංගයන් ද සෑම ආරාමයකම පාහේ පැවති බව තහවුරු විය.

මේ අතරින් කප්පච්චියෙන් හමු වූ විසිතුරු දිය අගල් ආදිය සහිත පබ්බත විහාරාරාම සංකීර්ණයක් ද වේ. මේ සියල්ලම සිතූ සේ නිදන් සොයන්නන් විසින් හාරා දමා තිබේ.

ගවේෂණයෙන් සොයාගන්නා ලද ශිලාලේඛන සංඛ්‍යාව දහනවයක් පමණ වේ. ඒවායින් දාහතක් කියවා පළමු වරට ප්‍රකාශයට පත් කරන ලද්දේ මේ පර්යේෂණයේ දී ය. තව ද මහා මාර්ග වශයෙන් භාවිත කළ මාර්ග පද්ධතියක් පිළිබඳව ද කරුණු මේ තුළින් සනාථ විය. ඒ සඳහා කොන්ග්‍රායන්කුලම්හි පැරණි පාලමක සලකුණු හා මැදවච්චිඑළිය පාලමක සලකුණු ද දැක්විය හැකි ය. විජය සමග මෙහි පැමිණි උපතිස්ස ඇමතියාගේ නගරය පිහිටියේ මේ ප්‍රදේශයේ ය යන්න යම් දුරකට සනාථ වන අවස්ථාවක් වශයෙන් මෙම පාලම් හා ඒ සම්බන්ධ මාර්ග සලකුණු හඳුනාගත හැකි ය. පුරාණ විනාශ වී ගොස් ඇති වැව් හා පොකුණු වශයෙන් ගත් විට මේ පර්යේෂණයේ ද දොළහක් පමණ ප්‍රමාණයක් සොයාගෙන තිබේ. මේවා සියල්ලම පාහේ ඇත්තේ විල්පත්තු වන මායිමට අයත් ප්‍රදේශයේ ය. මනා ජල කළමනාකරණයක් මේ යුගයේ එම ප්‍රදේශයේ පැවති බව සනාථ කරන අවස්ථාවක් වශයෙන් මේවා හඳුන්වා දිය හැකි ය.

මේ තුළින් සනාථ වන්නේ මෙම ප්‍රදේශයේ බෞද්ධ ගති ලක්ෂණ සියල්ලක්ම බෙහෙවින් අභාවයට ගොස් ඇත්තේ නූතන යුගයේ දී බව යි. ආරම්භයේ සිට ක්‍රි.ව. දහස පමණ වන තෙක් බෞද්ධ ප්‍රබෝධයෙන් අනූන ලක්ෂණ ප්‍රකට කළ මෙම ප්‍රදේශය මේ යුගයේ බෞද්ධ ගති ලක්ෂණයන්ගෙන් විනිර්මුක්ත කලාපයක් බවට පත්ව තිබේ.

සෑම කිලෝමීටර් හයකට පමණ දුරකින් පැහැදිලිව ම බෞද්ධ සංඝාරාම සංකීර්ණයක් මේ ප්‍රදේශයේ පිහිටා තිබුණු බැව් මේ පර්යේෂණයේ දී සනාථ විය. එයින් පැහැදිලි වන්නේ බෞද්ධ ප්‍රබෝධයෙන් අනූන ප්‍රදේශයක් වශයෙන් අඩුම තරමින් මාස ආක්‍රමණය දක්වා මේ ප්‍රදේශය උජ්වලිතව පැවති බව යි. එහෙත් ඉන් පසු ක්‍රමයෙන් අන්‍ය සාමයික වටපිටාවක් නිර්මාණය වන්නට ඇති බව සිතිය හැකි ය.

මේ ප්‍රදේශයේ සිංහල නම් වශයෙන් පැවති බෝහෝ ස්ථානයන් නූතනයේ දැක්වෙන්නේ ද්‍රවිඩ නම්වලිනි. එය මීට ශතවර්ෂයක පමණ සිට පැවත එන ක්‍රමවේදයක් බවට පත්ව තිබේ. මේ නිසා ප්‍රදේශයේ බෝහෝ ජනයා ද විශ්වාස කරනුයේ මෙම ප්‍රදේශය බෞද්ධ ගති ලක්ෂණවලට වඩා අන්‍ය සාමයික ගති ලක්ෂණයන් ප්‍රකට කරනු ලබන ප්‍රදේශයක් බව යි. එහෙත් මෙම අදහස වැරදි බව ඓතිහාසික සාධක හා නෂ්ටාවශේෂයන් අධ්‍යයනය කිරීමෙන් සනාථ වේ. මෙරට සංස්කෘතිය නිර්මාණය කළ ජනයාගේ අයිතිය මේ ප්‍රදේශයෙන් සෝදාපාලුවට යාම මේ තුළින් නිරීක්ෂණය වේ.

අනුරාධපුර නාගරික ශිෂ්ටාචාරයේ පරිහානියත් සමගම මෙම ප්‍රදේශ ජනශූන්‍ය වන්නට ඇති බව සිතිය හැකි ය. අන්‍ය සභ්‍යත්වයන් එම ප්‍රදේශවල

ව්‍යාප්ත වීමෙන් පසු ක්‍රමයෙන් හීනවී ගිය එම ප්‍රදේශවල බෞද්ධ සභ්‍යත්වය පිළිබඳ ජීවමාන සාධක නැවත නගාසිටුවීමක් සිදු නොවූ අතර බෞද්ධ සභ්‍යත්වය පිළිබඳ අජීවී සාධක වශයෙන් පවත්නා පුරාවිද්‍යාත්මක සාධකයන් ද මහත් අභියෝගයකට ලක්ව තිබේ.

**නිගමනය**

මල්වතුඔයෙන් දකුණු තිම්බිරයේ වව්නියාව දිස්ත්‍රික්කයේ උතුරු පලාතට අයත් ප්‍රදේශයේ බෞද්ධ සභ්‍යත්වය ඉතා දීප්තිමත්ව අනුරාධපුර යුගය පුරා පැවති බව තහවුරු වේ. එම ප්‍රදේශයේ පවත්නා බෞද්ධ නෂ්ටාවශේෂ තුළින් සනාථ වන්නේ එම ප්‍රදේශයේ තත්කාලීනව පැවති බෞද්ධ ප්‍රබෝධය යි. නූතනයේ ඒවා හුදු වනගහනයට පමණක් සීමා වී ඇති, නිදන් සොයන්නන්ගේ පාරාදීසයන් බවට පත්වී වේගයෙන් විනාශ වෙමින් පවතී. එම ප්‍රදේශයේ නූතනයේ බෞද්ධ බලයක් නැති අතර පැවති බෞද්ධ බලය සනාථ කිරීමට ඇත්තේ මෙකී පුරාවස්තු හා පුරා ස්ථානයයන්හි සාධක පමණි. තත් ප්‍රදේශයේ සිංහල බෞද්ධ ජනයා අතර රෝපණය කර ඇති එකී ප්‍රදේශය අන්‍යලබ්ධික අසිංහලයන්ගේ උරුම භූමියකි යන අදහස ස්ථාපනය වී තිබේ. මෙකී වැරදි මතය බණ්ඩනය කිරීමට ද, ඒ සඳහා පවතින දෘශ්‍යමාන පුරාවිද්‍යාත්මක ස්ථානයන් ද ආරක්ෂා කරගැනීම බෞද්ධ ආගමේ පුනර්ජීවනයට බෙහෙවින් උපකාරවත් වන බව මෙම පර්යේෂණයෙන් තහවුරු විය.

ප්‍රමුඛ පද: උතුරු පලාත, ගවේෂණය, බෞද්ධ අයිතිය, සභ්‍යත්වය, පුරාවස්තු